ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
வங்கியல்லா நிதியியல் நிறுவனங்களின் மேற்பார்வைத் திணைக்களம்
DEPARTMENT OF SUPERVISION OF NON-BANK FINANCIAL INSTITUTIONS

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

යොමු අංකය: 24/06/002/0002/002

2022 අප්‍රේල් 18

සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණනි/ මහත්මියනි,

**බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය උපකරණ මත ගෙවන උපරිම පොලී අනුපාතයන්හි සිදු කරන සංශෝධන**

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලය විසින් 2022.04.12 වන දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී පහත කරුණු සඳහා අනුමැතිය ලබා දී ඇති බව ඔබට මින් දැනුම් දෙනු ලැබේ.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 04 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත සංශෝධනය කිරීමේ විධානය අහෝසි කිරීම සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලද 2022.03.31 දිනැති ලිපිය ඉල්ලා අස්කර ගැනීම,

2. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 01 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයෙහි 2 වන වගන්තිය වන තැන්පතු සහ ණය උපකරණ මත 'අදාළ වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ එලදා අනුපාතිකය' අහෝසි කිරීම, සහ

3. පහත සඳහන් පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම්වලට තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත තීරණය කිරීමට ඉඩ ලබා දීම,

   (අ) පවත්නා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, සහ

   (ආ) පහත 1 වන වගුව සහ 2 වන වගුවෙහි දක්වා ඇති පරිදි අවසන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසි හතරෙහි බරිත සාමාන්‍ය එලදා අනුපාතයෙහි චල සාමාන්‍ය මත පදනම්ව, බලපත්‍රලාභී මුදල් සමාගම්වලට ඔවුන්ගේ අභිමතය පරිදි භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියට පසු දිනයේ දී තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාතික සංශෝධනය කිරීමට අවසරය හිමි වේ:

**01 වන වගුව : බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පතු සඳහා කල් පිරීමේ දී උපරිම පොලී අනුපාත**

**තැන්පතු සඳහා කල් පිරීමේ දී උපරිම පොලී අනුපාත**

| තැන්පතුවෙහි කාල සීමාව | වසරකට උපරිම පොලී අනුපාතය |
|---|---|
| තැන්පතු කාල සීමාව මසකට වඩා අඩු හෝ කල් පිරීම නිශ්චිතව දක්වා නොමැති ඉතුරුම් සහ අනෙකුත් තැන්පතු | දැනට පවතින නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය |
| **කාලීන තැන්පතු** | |
| මාසයක් සහ මාස 03කට වඩා අඩු | දින 91 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය එලදා අනුපාතය |
| මාස 03ක් සහ මාස 06කට වඩා අඩු | දින 182 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය එලදා අනුපාතය + 0.25% |
| මාස 06ක් සහ වසරකට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය එලදා අනුපාතය + 0.50% |

| | |
|---|---|
| වසරක් සහ වසර 02කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.00% |
| වසර 02ක් සහ වසර 03කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75% |
| වසර 03ක් සහ වසර 05කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25% |
| වසර 05ක් | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.25% |

**02 වගුව: බලපත්‍රලාභී මුදල් සමාගම්වල ණය උපකරණ සඳහා කල් පිරීමේ දී උපරිම පොලී අනුපාතික**

| ණය උපකරණවල කාල සීමාව | වසරකට උපරිම පොලී අනුපාතය |
|---|---|
| වසරකට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50% |
| වසරක් සහ වසර 02කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75% |
| වසර 02ක් සහ වසර 03කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25% |
| වසර 03ක් සහ වසර 05කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.75% |
| වසර 05ක් | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.75% |

කෙසේ වෙතත්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නිසි වත්කම් සහ වගකීම් කළමනාකරණ ක්‍රියාමාර්ගවලට අනුගතවීම තුළින් තැන්පත්කරුවන් වෙත පිරිනමනු ලබන උපරිම පොලී අනුපාත කෙරෙහි සුපරීක්ෂාකාරී විය යුතුය.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 01 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයේ වගන්ති 1.1(i), වගන්ති 1.1(ii), සහ වගන්ති 1.2 මෙමගින් අහෝසි කෙරේ.

මීට විශ්වාසී,

ආර්. එම්. සී. එච්. කේ. ජයසිංහ (මහත්මිය)
**අධ්‍යක්ෂ**

ඇමුණුම්: ඇමුණුම I

ඇමුණුම I

## අවසන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසි හතර මත පදනම්ව 2022.04.18 දිනට අදාළ වන උපරිම පොලී අනුපාතික ගණනය කිරීම

### 1 වන වගුව: බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයෙහි චල සාමාන්‍ය ගණනය කිරීම

| අවසන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසි හතර | 2022-අප්‍රේල්-11 | 2022-අප්‍රේල්-6 | 2022-මාර්තු-30 | 2022-මාර්තු-23 | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයෙහි චල සාමාන්‍ය |
|---|---|---|---|---|---|
| දින 91 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය | 19.71 | 14.12 | 12.92 | 12.10 | **14.71** |
| දින 182 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය | 22.73 | 15.36 | 12.25 | 11.98 | **15.58** |
| දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය | 23.36 | 15.69 | 12.28 | 12.00 | **15.83** |

### 2 වන වගුව: කාලීන තැන්පතු මත උපරිම පොලී අනුපාත ගණනය කිරීම

| කාලීන තැන්පතුවල කාල සීමාව | වසරකට උපරිම පොලී අනුපාතය | වර්තමානයේ දී අදාළ වන උපරිම පොලී අනුපාතය (%) |
|---|---|---|
| මාසයක් සහ මාස 03කට වඩා අඩු | දින 91 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය | 14.71 |
| මාස 03ක් සහ මාස 06කට වඩා අඩු | දින 182 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.25% | 15.58 + 0.25 = 15.83 |
| මාස 06ක් සහ වසරකට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50% | 15.83 + 0.50 = 16.33 |
| වසරක් සහ වසර 02ට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.00% | 15.83 + 2.00 = 17.83 |
| වසර 02ක් සහ වසර 03ට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75% | 15.83 + 2.75 = 18.58 |
| වසර 03ක් සහ වසර 05ට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25% | 15.83 + 3.25 = 19.08 |
| වසර 05 | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.25% | 15.83 + 4.25 = 20.08 |

[Limited Sharing]

**3 වන වගුව: ණය උපකරණ මත උපරිම පොලී අනුපාත ගණනය කිරීම**

| ණය උපකරණවල කාල සීමාව | වසරකට උපරිම පොලී අනුපාතය | වර්තමානයේ දී අදාළ වන උපරිම පොලී අනුපාතය (%) |
|---|---|---|
| වසරකට අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50% | 15.83 + 0.50 = 16.33 |
| වසරක් සහ වසර 02කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75% | 15.83 + 2.75 = 18.58 |
| වසර 02ක් සහ වසර 03කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25% | 15.83 + 3.25 = 19.08 |
| වසර 03ක් සහ වසර 05කට වඩා අඩු | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.75% | 15.83 + 3.75 = 19.58 |
| වසර 05 | දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.75% | 15.83 + 4.75 = 20.58 |